මව්රට දැන් ඉරිදා
2026 ජූලි 19

# හාට්

හදවත් හිරිවට්ටන් තැන... HEART

# SUMATHI AWARDS 2026

මෙරට ටෙලිනාට්‍ය කලාවට සුවිශේෂ මෙහෙවරක් ඉටුකරන සුමති ටෙලි සම්මාන උළෙල පසුගිය 15 වැනිදා ශ්‍රී ජයවර්ධනපුර මොනාක් ඉම්පීරියල් හෝටල් පරිශ්‍රයේදී කලා ක්ෂේත්‍රයේ තරු රැසකගේ සහභාගිත්වයෙන් මහත් උත්සවශ්‍රීයෙන් පැවැත්විණි. 1995 වසරේ ආරම්භ කරන ලද සුමති ටෙලි සම්මාන උළෙල මෙවර පැවැතියේ 31 වැනි වරටය.

එහිදී හොඳම ටෙලිනාට්‍ය නළුවා සම්මානය සෞම්‍ය ලියනගේ විසින්ද, හොඳම ටෙලිනාට්‍ය නිළිය සම්මානය තරින්දි ප්‍රනාන්දු විසින්ද, හොඳම ටෙලිනාට්‍ය සහාය නළුවා සම්මාන වසන්ත මොරගොඩ විසින්ද, හොඳම ටෙලිනාට්‍ය සහාය නිළිය සම්මානය චම්පා ශ්‍රියානි විසින්ද දිනාගන්නා ලදී.

ජනප්‍රියතම නළුවා සම්මානය අඛිල ධනුද්ධර විසින් හිමිකරගත් අතර, ජනප්‍රියතම නිළිය සම්මානය හිමිකර ගත්තේ දුශේනි මියුරංගි විසිනි. වසරේ නැගී එන නළුවා ලෙස චතුරංග කොඩිතුවක්කු සම්මානයට පාත්‍ර වූ අතර, විනූ පෙරේරා වසරේ නැගී එන නිළිය ලෙස සම්මානයට පාත්‍ර විය.

මෙවර සුමති ටෙලි සම්මාන උළෙලේ හොඳම ප්‍රාසාංගික ටෙලිනාට්‍යය ලෙස 'රට පවුල' ටෙලිනාට්‍යයත්, ජනප්‍රියතම ටෙලිනාට්‍යය ලෙස 'පාට කුරුල්ලෝ' ටෙලිනාට්‍යයත් සම්මානය දිනාගන්නා ලදී. මීට අමතරව තවත් කලා ශිල්පීන් රැසක්ද මෙහිදී අගැයීමට ලක්වීම විශේෂත්වයකි.



Akhila & Dusheni



Click by NEXUS Photography



# ප්‍රේමණීය නගරයෙන් ආ ආදරණීය හිමාෂි මිස්...

## කාත් එක්කවත් තරගයක නැහැ... මම මගේ ගමන යනවා...

වේදිකාවේ සොඳුරු රඟමඬලෙන් ඇරඹි ඒ අපූර්ව කලා චාරිකාව, පසුකාලීනව සම්මානනීය ඇගයීම්වලින් අභිෂේක ගැන්වුණි. එතැනින් නොනැවතී, පුංචි තිරයත්, රිදී තිරයත් එකසේ තමන්ගේ රංග ප්‍රතිභාවෙන් හැඩ කරන්නට ඇයට හැකි විය. මේ දිනවල ඇය ප්‍රේක්ෂක අප හමුවට පැමිණෙන්නේ කාගේත් ආදරය දිනාගත් 'හිමාෂි' ලෙසිනි. ඇය, රංගනයේ සොඳුරු ඉසව් සොයා යන දක්ෂ රංගන ශිල්පිනී නිපුණි පූජිත ගුණවර්ධනය.

**නිපුණි ගුණවර්ධන**

**මේ දිනවල ඔබව ගොඩ දෙනෙක් දැනහඳුනා ගන්නේ හිමාෂි ටීචර් ලෙස. ඒ ගැන අපි මුලින්ම කතා කරමු?**

හිමාෂි ටීචර්ගේ චරිතය මම කාලෙකින් රඟපාපු තවත් ආදරණීය චරිතයක්. 'ගේට්ටුවා' ටෙලිනාට්‍යය නරඹන ගොඩ දෙනෙක් මාව ඒ හරහා හඳුනනවා.

**මේ දිනවල හිමාෂිගේ චරිතයට විතරද ඔබ රංගනයෙන් දායක වෙන්නේ?**

පසුගියදවස්වල චිත්‍රපටයකට සම්බන්ධ වෙලා ඒ කටයුතු අවසන් කළා. ළඟදීම අලුත් ටෙලිනාට්‍යයකින් ප්‍රේක්ෂකයන් අතරට එනවා. ඊට අමතරව 'අහිංසක පුංචි ඝාතනය' වේදිකා නාට්‍යයේ පුහුණුවීම් කරගෙන යනවා. තව මම සම්බන්ධ වුණු ටෙලිනාට්‍ය කිහිපයක් විකාශය වෙන්න තියෙනවා. දැන්ම කියන්න අමාරුයි ඒ නිර්මාණ කොයි වගේ කාලයක විකාශය වේවිද කියලා. දැනට 'ගේට්ටුවා' ටෙලිනාට්‍යයේ හිමාෂි චරිතය විතරයි.

**මේ ලැබුණු ගුරු පත්වීම ගැන කතා කළොත්?**

ලසිත කාරියවසම් සහ ටෙලිනාට්‍යයේ නිෂ්පාදක මලිත් කුලතිලක හරහා තමයි මට මේ අලුත් ගුරු පත්වීමට ආරාධනා ලැබුණේ. සාමාන්‍යයෙන් ගුරුවරුන්ට මුල්ම පත්වීම ලැබෙන්නේ දුෂ්කර ප්‍රදේශයක. ගොඩක් ගුරුවරු කැමැති නැහැ දුෂ්කර පත්වීම්වලට යන්න. හැබැයි හිමාෂි මිස් ඊට වඩා හාත්පසින්ම වෙනස් කෙනෙක්. හිමාෂි එහෙම හිතන කෙනෙක් නෙවෙයි. ඇයට පත්වීම ලැබෙන්නේ දුෂ්කර පළාතක පාසලකට. අඩු පහසුකම් යටතේ දරුවන් සුළු පිරිසකට උගන්වන්න. ගොඩක් ආශාවෙන් තමයි හිමාෂි මිස් පාසලේ වැඩ කරන්නේ. ඒ වගේ චරිතයක් මට රඟපාන්න ලැබීම ගැන සතුටුයි. ඒ වගේ හිතන ගුරුවරු අදටත් ඉන්නවා. ඒ සියලු දෙනා වෙනුවෙන් මට මේ චරිතය ප්‍රේක්ෂකයන් අතරට අරන් යන්න ලැබීමත් එක පැත්තකින් වාසනාවක්.

**නිපුණි දැන් ආදරවන්තියක්ද එතකොට?**

තවම මම ආදරය විඳින කෙනෙක් නෙවෙයි. ප්‍රේම සම්බන්ධයක් ගැන මම තවම හිතලා නැහැ. බලාපොරොත්තු වෙනවා ආදරය කරන්න. ආදර ඇරයුම් නම් ලැබෙනවා. බලමු අපි ඉදිරියේදී අවංක ආදරයක්. මාව තේරුම් ගත්ත කෙනෙක් ලැබුණොත්.

**මේ වනවිට ඔබේ සිනමා දායකත්වය ගැන කතා කළොත්?**

මම චිත්‍රපට කිහිපයකටම සම්බන්ධ වුණා. චින්තන ධර්මදාසගේ 'අභිසාරි' චිත්‍රපටය ළඟදීම තිරගත වෙයි. දිල්ෂාන් පතිරත්නගේ 'යකාරේ වන්' චිත්‍රපටයේ රූගත කිරීම්වලට පසුග ිය දවස්වල සම්බන්ධ වුණා. රංගන ශිල්පියෙක්ගේ හෝ ශිල්පිනියකගේ තියෙන සිහිනයක් තමයි සිනමාව කියන්නේ. මගෙත් ඒ වගේ සිහිනයක් තියෙනවා. මම ගොඩක් කැමැති සිනමාව පැත්තෙන් වැඩ කරන්න.



**'මිස් වර්ල්ඩ්' තරගය හරහා නේද ඔබේ ගමන පටන් ගන්නේ?**

මම මුලින්ම වෙළෙඳ දැන්වීම් හරහා තමයි ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නේ. 2018 මිස් වර්ල්ඩ් ශ්‍රී ලංකා 'සියත' තරගයට ඉදිරිපත් වුණා. එහි අවසන් 11 දෙනා අතරට මම තරග කළා. පොඩි කාලේ ඉඳලා තිබුණු හීනයක් තමයි පැජන්ට් එකකට සම්බන්ධ වෙන එක. ඉතින් මට ඒ හරහා ගොඩක් අත්දැකීම් ලබාග න්න පුළුවන් වුණා. කැලණිය විශ්වවිද්‍යාලයේ පසුකාලීනව උපාධියක් හැදෑරුවා.

**ඒ සම්බන්ධ වීම සම්මාන දක්වා ලොකු දුර ගමනක් ආවා?**

'ප්‍රේමයේ නගරය' වේදිකා නාට්‍යයේ රංගනය වෙනුවෙන් මට කුසලතා සම්මානයක් ලැබුණා 2019 රාජ්‍ය නාට්‍ය උළෙලේදී. 'බයිලා ගහන දවසක්' කෙටි නාට්‍යය යෞවන සම්මාන උළෙලේ හොඳම සහාය නිළියට හිමි කුසලතා සම්මානයත්, 2025 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නිළියට මම නිර්දේශ වුණා 'බයිලා ගහන දවසක්' කෙටි නාට්‍යය වෙනුවෙන්.

**නිපුණි ෆීල්ඩ් එක ගැන පැහැදීමකින්ද වැඩ කරන්නේ?**

කලකිරුණු අවස්ථාත් නැතුවාම නෙවෙයි. අපි කොයි ක්ෂේත්‍රයක කොහොම හිටියත් අපි මිනිස්සු සමග ගනුදෙනු කරනවා. අපිට 100%ක් පුරිපූර්ණ අය හමුවෙන්නේ නැහැ. මම වුණත් එහෙම නැහැ. යම් යම් තැන්වලදි ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. ඉතින් ඒ දේවල් ගැන ලොකුවට හිතන්නේ නැතුව සාමාන්‍ය විදියට අපේ ගමන ගියා නම් හරි.

**වසන්ත විතාරණගේ**

> හිමාෂි මිස් දන්නේ නැහැ රන්මලීගේ ජීවිත කතාව පැත්ත.

> චිත්‍රපටයකට සම්බන්ධ වෙලා ඒ කටයුතු අවසන් කළා.

> තවම මම ආදරය විඳින කෙනෙක් නෙවෙයි...



'සිරස ඩාන්සින් ස්ටාර් සීසන් 2'හි අනුශූරතාව දිනාගත් ඔහු හිප්-හොප් නර්තනයෙන් ලංකාවේ මයිකල් ජැක්සන් නමින් ප්‍රේක්ෂක ආදරය දිනාගැනීමට සමත් වුණා. නර්තනයට පමණක් නොව චිත්‍ර හා මූර්ති නිර්මාණය, ඇඳුම් නිර්මාණය සහ රෝල ස්කේට් හා රෝල බෝල් ක්‍රීඩාවේ ලංකාවේ නම ජාත්‍යන්තරයට ගෙනගිය ක්‍රීඩකයෙක්, පුහුණුකරුවෙක්. ඔහු නමින් ලසන්ත ප්‍රමුදිත සිල්වායි.

# වීල් එක්ක ඩාන්ස් කරන රෝලර් බෝල් ගෝල් ගහන ලංකාවේ මයිකල් JACKSON

## ඩාන්සින් කියන්නේ මගේ හුස්ම වගේ...

ලසාන්ත ප්‍රමුදිත සිල්වා





ගෝල් එක ගත්තේ මම පෝලන්ඩ් එක්ක තිබ්බ තරගයේ.

**මේ දවස්වල මොකද වෙන්නේ?**

මේ දවස්වල මයිකල් ජැක්සන්ගේ ෆිල්ම් එකේ රිලීස් එක එක්ක මම නර්තන ප්‍රසංග රැසක් කළා. ඊට අමතරව මගේ නර්තන පාසලේ ඉගැන්වීම් කටයුතු හා ක්‍රීඩාමය පැත්තෙන් රෝලර් ස්කේටින් හා රෝලර් බෝල් පුහුණුවීම් කටයුතු කරගෙන යනවා.

**ඩාන්සින් ජීවිතේ වෙලා දැන් ගොඩක් කල් ඇති?**

ඩාන්සින් එක්ක මගේ බැඳීම පටන් අරන් අවුරුදු විසිපහකට වැඩියි. පාසල් යන කාලේ ඉඳන්ම ඩාන්සින් කළා. ඒ බැඳීම මගේ හුස්ම වගේ. නවත්වන්න බැහැ. නවත්වන්න හිතුණෙත් නැහැ. ඒ තරම් මම නර්තනයට ආදරෙයි. මගේ දැන් ජොබ් එකත් ඩාන්සින්.

**මයිකල් ජැක්සන්ට ගොඩක් කැමැතියි නේද?**

මම පොඩි කාලේ ඉඳන්ම මයිකල් ජැක්සන්ට ආදරේ කළා. ආසා කළා. මට මයිකල් ජැක්සන්ගේ රටට යන්නත් අවස්ථාව ලැබුණා. නමුත් මට ඔහුව දැකගන්න හම්බවුණේ නම් නැහැ. විදේශ සංගීත ප්‍රසංග දෙකකදි ඔහුව හම්බවෙන්න තිබුණු අවස්ථා දෙකක් මිස්වුණා.

**සිරස ඩාන්සින් ස්ටාර් ගැනත් කතා කරමු?**

සිරස ඩාන්සින් ස්ටාර් මගේ ගමනේ තවත් සන්ධිස්ථානයක්. දෙවැනි අදියරයේ මායි කුෂානි සඳරේඛායි අනුශූරතාව දිනාගත්තා. ඊට පස්සේ සීසන් 3 එකේදී මම කොරියෝග්‍රැෆර් කෙනෙක්. මට ඩාන්සර්ස්ලා 5ක් ලැබුණා. මම ඒ අයව හොඳම දහදෙනා අතරට ගෙනාවා. ඒක කොරියෝග්‍රැෆර්ස්ලා අතර තරගයක්. ෆයිනල් එකට දෙන්නෙක් තේරුණා. ඒකෙන් දෙවැනි සහ තුන්වැනි ස්ථාන දෙකම මට ආවා. දැන් මේ පාර සිරස ඩාන්සින් ස්ටාර් එකේ මායි රමෝද් දෙන්නම මුළු වැඩසටහනේම උපදේශකවරු විදිහට වැඩ කරනවා.

**ඔබ හිප්-හොප් නර්තනය පටන් ගත්තු කාලේ මිනිස්සු හිප්-හොප් ගැන දැනගෙන හිටියද?**

ඒ කාලයේ හිප්-හොප් නර්තනය ගැන ලංකාවේ බොහෝ දෙනා දැනුවත් වෙලා හිටියේ නැහැ. වෙඩින්වල තිබුණේ සාම්ප්‍රදායික නර්තන විතරයි. අපි තමයි පළමුවැනි වතාවට වෙඩින්වල හිප්-හොප් ඇක්ට් එකක් කරන්න අවස්ථාව ඉල්ලුවේ. නිවැරදි මාර්ගයක ඉඳන් අලුත් දෙයක් කරන්න ඕනෙ කියන ආශාව ඒ කාලේ අපේ හිතේ තිබුණා. හිප්-හොප් කියන වචනයවත් එතරම් ප්‍රචලිත වෙලා තිබුණේ නැහැ.

## හිප්-හොප් ඉගෙන ගන්න තැනක් තිබුණේ නැහැ...

**මයිකල් ජැක්සන්ගේ ඇඳුම් ඒ විදිහටම ප්‍රතිනිර්මාණය කරනවා කියන්නේ ඇත්තද?**

ඇත්ත. මයිකල් ජැක්සන්ගේ ඇඳුම්වල තිබුණු හැම සියුම් දෙයම, හැම මැහුමකම අර්ථය මම තේරුම් අරන් මගේ අතින්ම නිර්මාණය කරනවා. මොකද අපි නර්තනයට විතරක් නෙවෙයි, පෙනුමටත් සාධාරණයක් කරන්න ඕනෙ. ඒක තමයි මයිකල් ජැක්සන්ට දෙන උපහාරය.

**ඔබ නර්තන පාසලක් පටන් අරන් කොච්චර කල්ද?**

මගේ ටොරෙන්ෂල් නර්තන පාසලට අවුරුදු විසිපහක් වෙනවා මේ දෙසැම්බර් මාසෙට.

හැම මැහුම් නිර්මාණයක්ම මගේ අතින්ම මම නිර්මාණය කරනවා.

**දෙරණ සිටි ඔෆ් ඩාන්ස් ගැන මතකය ?**

දෙරණ සිටි ඔෆ් ඩාන්ස් සීසන් වන් එකේ කොරොයෝග්‍රැෆි කළා. එකේ සෝලෝ ඩාන්ස් කැටගරි එකේ මුල්ම ජයග්‍රාහකයා වුණේ සුපුන් අබේසිංහ. අද ඔහු ලංකාවේ හොඳ තැනක ඉන්නවා. කණ්ඩායම් අංශයෙන් ජයග්‍රහණය කළේ මම කොරියොග්‍රැෆි කරපු රෝයල් වොරියර්ස් කණ්ඩායම.

**ඩාන්සින් කොරියෝග්‍රැෆිවලින් ඔබ සම්මානයට පාත්‍ර වුණා?**

ඔව්. සුරේනිගේ ආදරෙයි නම් එන්න මා වෙත, රන්දීර්ගේ ඕයේ ඔජායේ, භාතිය ඇන්ඩ් සන්තුෂ්ගේ බයිලා ගමුද රිමික්ස් කරලා ගීතයටත් දෙරණ මියුසික් වීඩියෝ අවෝර්ඩ් සම්මාන උළෙලේදි මට පිට පිට සම්මාන තුන් වතාවක් ලැබුණා.

**රෝද සපත්තු පදින්න ගත්තේ කොහොමද?**

දවසක් කොළඹදි දැක්කා රෝද සපත්තු තියෙනවා. මම රෝද සපත්තු දෙකක් අරන් ඇවිත් හැමෝටම හොරෙන් තනියම පුරුදු වෙලා මගේ යාළුවන්ටත් පුරුදු කළා. වැරදියට පැදලා තමයි හරියට පදින්න පුරුදු වුණේ. දැන් රෝද සපත්තුවලින් ඩාන්සින් පවා කරනවා. ලංකාවේ මුලින්ම ලොකු ප්‍රසිද්ධියක් දීලා රෝද සපත්තු රේස් එකක් කළේ මම. මම මගේ ඩාන්සින් ටීම් එකේ අයට බලෙන් පුරුදු කළා.

## හැමෝටම හොරෙන් තනියම පුරුදු වුණා...

තරග සංවිධාන කරලා පුහුණු වීම් කරලා ස්ටේජ් පවා හදලා අන්තිමට තරගයේ රෝද සපත්තු පදින්නත් ගියා.

**එතකොට රෝල බෝල්වලට චාන්ස් හම්බුණා කියන්නේ?**

අපි කරපු හැම රේස් එකකම වීඩියෝ යූටියුබ් දැම්මා. ඒක දැකලා තමයි ඉන්දියාවේ සර් කෙනෙක් අපිට රෝලර් බෝල් ගේම් එක හඳුන්වලා දුන්නෙත්. හැන්ඩ් බෝල් වගේම තමයි වෙනසකට තියෙන්නේ රෝද සපත්තු දාගෙන ක්‍රීඩා කරන එක. අපි ප්‍රැක්ටිස් කරලා රටවල්වලට ගිහින් ක්‍රීඩා කරලා ලංකාවට ජයග්‍රහණත් අරගෙන ආවා.

**රෝල බෝල් සම්බන්ධ වටිනම මතකයක් මතක් කරමු?**

ලංකාව වෙනුවෙන් මුල්ම ගෝල් එක ගත්තේ මම පෝලන්ඩ් එක්ක තිබ්බ තරගයේ. ඒක අපි ජයග්‍රහණය කළා. ඒක මගේ වටිනම මතකයක්.

**ඉදිරි වැඩකටයුතු?**

මගේ නර්තන පාසලේ සංවත්සරය වෙනුවෙන් විශේෂ දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව මම ඩාන්සින් කොරියෝග්‍රැෆි කරපු චිත්‍රපට, මියුසික් වීඩියෝ කිහිපයක් රිලීස් වෙන්න තියෙනවා.





ස්ටෙෆනි කොතලාවල

# මට මගේම කියන උන් වළ කැපුවා...

මේ ලියන්න සූදානම් වෙන්නේ සේධාවී මුදියන්සේලාගේ දමිතා බුද්ධිනී අබේරත්න බණ්ඩාර ගැනයි. නිළියක් ලෙස කලා ක්ෂේත්‍රයට එනකොට ඇගේ නම රිදී තිරය සහ ටෙලි තිරය මත සටහන් වෙන්නේ දමිතා අබේරත්න විදියටයි. දමිතා රංගන කලාවට එන්නේ ළමා කාලයේ ඉඳලමයි. ඉන් පස්සේ නව යෞවනියක ලෙස මෙන්ම තරුණ කාන්තාවක ලෙසද මේ චරිතාංග නිළි තාරකාව හරි අපූරුවට කරළිය ජය ගන්නවා. ලොව පුරා සැරිසරන ඈත ගමනක් යන ඈ සුළං කිරිල්ලියක ලෙස ජාත්‍යන්තරවද සම්මානනීය වෙනවා. නිළියක ලෙස ඇය ආරම්භ කළ ජයග්‍රාහී ගමනට දශක ගණනාවක් ගෙවී ගියත් අදටත් ඈ නිළියක ලෙස ටෙලි කලාව මෙන්ම සිනමා කලාව තුළද තම රංගන කෞශල්‍යයෙහි ප්‍රතිභාව මොනවට සනාථ කොට හමාරයි. 'රූම් නම්බර් 106' කියන්නේ ඒ සඳහා වන නවතම නිදසුනයි.



මගේ ගමන දශක හතරක එහෙමත් නැත්නම් අවුරුදු 40කට ආසන්න අතීතයක් ඇති ගමනක්.

**ඔන්න දමිතා හදවතින්ම පිළිග න්නවා ඔයාව 'හාට්' ටැබ්ලොයිඩ් එකට?**

සතුටුයි අත්තටම මේ කතාබහට ආරාධනා කළාට. 'මව්රට' කියන්නේ කලා ශිල්පීන්ට නිදහසේ තම සිතුම් පැතුම් බෙදාහදාගන්න පුළුවන් පත්තරයක් වීම ගැනත් සතුටු වෙනවා.

**කියමු බලන්න ඔබේ අලුත්ම වංහුං ටිකක්?**

සතුටින් ජීවිතයට මුහුණ දෙනවා. 'රූම් නම්බර් 106' චිත්‍රපටය තිරගත වන අතරතුර තවත් අලුත්ම චිත්‍රපට දෙකක් දොරට වඩින්න සූදානමින් තියෙනවා. ඒ අතර විකාශය වන ටෙලිනාට්‍ය තුනකම ෂූටින්වලට සහභාගි වෙනවා.

**වේදිකා නාට්‍ය දෙකකටත් ආරාධනා ලැබිලා තියෙනවලු?**

ඔව්. වේදිකා නාට්‍ය දෙකෙන් එකක් තෝරාගෙන අවසානයි. අනෙක් නාට්‍යය බාරග න්නවද නැද්ද කියන කාරණය ගැන තවම හිතලා නැහැ කිව්වොත් හරි.

**ඒ වේදිකා නාට්‍යය භාරගන්න ප්‍රමාද වෙන හේතුව ඇහුවොත් කියන්න පුළුවන්ද දමිතා?**

තවත් අලුත්ම ටෙලිනාට්‍ය දෙකකටම ගිවිසුම් අස්සන් කරපු නිසා වේදිකා නාට්‍ය දෙකකට රංගන දායකත්වය දෙන්න පුළුවන් වේවිදැයි කියන ප්‍රශ්නය නිසා තමයි ඒ ප්‍රමාදය තුළ ඉන්නේ.

**හිටපු ගමන්ම වගේ ඔබ ආයෙත් වැඩ ගොඩකට මැදිවෙලා?**

ඔව්. මම හුඟ ක් සතුටින් ඉන්නේ ආයෙමත් වැඩ කරන්න අවස්ථාව ලැබිලා තියෙන නිසා.

**ඉතින් ඇයි දමිතා ඔබ කලා කටයුතුවලින් ඈත් වෙලා හිටියේ?**

මම ඈත්වෙලා හිටියේ නැහැ. කවදාවත් කලාවෙන් ඈත් වෙන්නත් මට බැහැ. ඒත් මට කිසිම කලා නිර්මාණයකට සහභාගි වෙන්න තියෙන අවස්ථාව යම් පිරිසක් විසින් අහිමි කරපු නිසා මට ටෙලි සිනමා ඇතුළු අනෙක් සියලු කලා කටයුතුවලින් ඈත් වෙන්න සිද්ධ වුණා.

**කවුද ඔය කියන පිරිස? ඔවුන් එහෙම කරපු හේතුව මොකක්ද?**

මාත් එක්කම හිටපු කලා ක්ෂේත්‍රයේ මගේම කියන පිරිස තමයි එහෙම කළේ. හැමෝම නෙවෙයි. කාගේ හෝ දියුණුවට අකුල් හෙළන කාගේ හෝ කකුලෙන් අදින්න බලාගෙන ඉන්න පිරිසක් එතැන හිටියා. ඊට හේතුව වුණේ මම ක්‍රියාකාරී දේශපාලනයට මැදිවීම සහ අරගලයට සහභාගි වීමයි.

**කලාකරුවන් බොහොමයක් පසුගිය සමයේ දේශපාලනයට මැදි වුණා. ඔවුන්ට එහෙම ගැටලු තිබුණේ නැහැ?**

කලාවෙන් ඈත්වෙලා හිටියේ නිර්මාණ ලැබෙන එකට යම් පිරිසක් විසින් අකුල් හෙළපු නිසයි.

අන්න ඒක තමයි මටත් තියෙන ප්‍රශ්නේ. ඇයි මට විතරක් මේ වෙනස්කම්. දේශපාලනයට මැදිවුණු, එයින් බොහෝ ලාභ ප්‍රයෝජන ලබාගත්ත පිරිස මොන තරම් හිටියද? ඒත් එක සත පහකවත් වාසියක් දේශපාලනයෙන් හම්බ නොකරපු මට මගේම කියන අය අකුල් හෙළුවා.

**ඒ වෙනස් විරසකයට හේතුව මොකක්ද දමිතා?**

හිතාගන්න බැරි කාරණය ඒකයි. මට වැඩ දෙන්න එපා, කලාව කියන මාධ්‍ය තුළ ආයෙම මට ඔළුව උස්සන්න ඉඩ දෙන්න එපාය කියලා ටෙලි සිනමා අධ්‍යක්ෂවරුන්ට සහ නිෂ්පාදකවරුන්ට ඔවුන් බලපෑම් කොට තිබුණා.



**ඔබ අරගලයේ ක්‍රියාකාරී සාමාජිකාවක් වුණේ සුපිරි බෙන්ස් කාර් එකක් යම් දේශපාලකයකුගෙන් ඔබට ලැබුණු නිසා කියලා කතාවක් තිබුණා?**

ඔන්න ඕවා තමයි පදනම් රහිත චෝදනා. මම බෙන්ස් එකක් ගත්තේ ඊට අවුරුදු

---





මෙරට සිනමා ක්ෂේත්‍රයේ නිළි රැජින ලෙස කිරුළු පැලඳි, අග්‍රගණ්‍ය සිනමා නිළි මාලනී ෆොන්සේකා රංගනයෙන් දායක වූ අවසන් රංගනය රැගත් 'මොණර විලක්' චිත්‍රපටය එළැඹෙන ජූලි 24 වැනි දින සිට එම්.පී.අයි. ප්‍රදර්ශන මණ්ඩලයේ බෙදාහැරීමක් ලෙසින් දිවයින පුරා තිරගත වීමට නියමිතව ඇත. මෙහි ඇති විශේෂතා කිහිපයකි. සනත් ගුණතිලක සමගින් මාලනී ෆොන්සේකා එක්ව රඟපෑ අවසන් චිත්‍රපටය මෙන්ම, ආචාර්ය වික්ටර් රත්නායක සමගින් කලාසූරී ලතා වල්පොල එක්ව ගී ගැයූ අවසන් චිත්‍රපටයද මෙය වේ.

එසේම අකාලයේ අප අතරින් සමුගත් චරිතාංග නළු දර්ශන් ධර්මරාජ් රංගනයෙන් දායක වූ අවසන් චිත්‍රපට කිහිපය අතරින්ද එකකි. මෙහි ඇති තවත් විශේෂත්වයක් වනුයේ, ආචාර්ය වික්ටර් රත්නායක ගී තනු නිර්මාණය කරමින්, සංගීතය සපයමින් ගීත ගායනයේ නිරත වන අවසාන චිත්‍රපටයද මෙය වීමයි.

යොවුන් නිර්මාණකරුවකු වූ රසික ලියනගේ තිරරචනය කරමින් අධ්‍යක්ෂණය කළ කුලුඳුල් සිනමා නිර්මාණය වූ 'මොණර විලක්' සනත් ගුණතිලක, මාලනී ෆොන්සේකා, දර්ශන් ධර්මරාජ් සමගින් රොෂාන් රණවන, වසන්ත කුමාරවිල, උමයංගනා වික්‍රමසිංහ, වීණා ජයකොඩි, දයාන් විතාරණ, ගයනා සුදර්ශනී ,චන්දන එදිරිසිංහ, ජීව්‍යා හංසනී, සෝමපාල ලීලානන්ද ඇතුළු රංගන ශිල්පීන් රැසක් රංගනයෙන් දායකව ඇත. කැමරා අධ්‍යක්ෂණයෙන් ජනක චමින්ද අත්තනායක, ශබ්ද සැලසුම්කරණයෙන් ඩිරාන් ජයසිංහ, සංස්කරණය සහ වර්ණ සංකලනයෙන් මේඝ කොළඹගේ, නිෂ්පාදන කළමනාකරණයෙන් මහේෂ් නිමන්ත, අංගරචනය සහ කොණ්ඩා මෝස්තර නිර්මාණයෙන් සෑම් පෙරේරා සමගින් මනෝජ් ලක්සිරි, කලා අධ්‍යක්ෂණයෙන් සහ ඇඳුම් නිර්මාණයෙන් බන්දුල වීරසේකර, සහාය අධ්‍යක්ෂණයෙන් චන්දන එදිරිසිංහ, සටන් අධ්‍යක්ෂණයෙන් වසන්ත කුමාරවිල, සංගීත අධ්‍යක්ෂණය සහ ගී තනු නිර්මාණයෙන් ආචාර්ය වික්ටර් රත්නායක, පසුබිම් සංගීතයෙන් සරත් වික්‍රම සමගින් ඩිරාන් විජේසිංහ, පසුබිම් ගායනයෙන් ආචාර්ය වික්ටර් රත්නායක, කලාසූරී ලතා වල්පොල, ඉෂාක් බෙග්, චමින්ද වල්පොල, ප්‍රීතිශා වල්පොල සහ සහන් ගුණවර්ධන එක්වී ඇති 'මොණර විලක්' ලලන්ත ගුණවර්ධන සමගින් හර්ෂණ ජයතිලක එක්ව නිෂ්පාදනය කර ඇත.

දමිතා අබේරත්නව

# බිමට ඇදලා දාන්න කාටවත් බැරි වුණා...

# දමිතගෙ දැන් ඉමේජ් නැහැ ගන්න එපා ෆිල්ම් එක වැටෙයි...

# ලක් අම්මා කියලා මට පහර ගැහුවා... ඒත් මං වැටුණේ නැහැ...








9කට කලින්. මම කලාවෙන් හම්බකරගත්ත සල්ලිවලින්. මම ගෙවල් හැදුවේ ලස්සනට ජීවත් වුණේ මගේම සල්ලිවලින්. මම රංගනයට අවතීරණ වුණේ ළමා නිළියක ලෙසයි. මගේ ගමන දශක හතරක එහෙමත් නැත්නම් අවුරුදු 40කට ආසන්න අතීතයක් ඇති ගමනක්. ඒ කාලය පුරා මම කලා නිර්මාණ බොහොමයකට දායක වුණා. ජාත්‍යන්තර වශයෙන්ද කීර්තියක් මේ රටට ගෙනත් දුන්නා. ඒ කිසිවක් මතක නැති ගානටයි මගේම කියන පිරිසක් මට ඒ අභූත චෝදනා කළේ. දේශපාලනයෙන් හොඳට හම්බ කරගත්ත ප්‍රවීණයන් පවා සිටියදී තමයි මට විතරක් එහෙම කළේ.

**ඔබ වෙනුවෙන් කතා කරන්න කවුරුවත්ම හිටියේ නැද්ද?**

මගේ එකවුන්ට්ස් චෙක් කරනකොට අනෙකුත් වත්කම් නිරීක්ෂණය කරන විට නීතිය හමුවේ මාව ප්‍රශ්න කිරීම්වලට මැදිවන විට මං වෙනුවෙන් කලා ලොවේ යම් මානුෂීයයි කියන පිරිසක් මැදිහත්ව සිටියා. කලා නිර්මාණ මට අහිමි වෙනකොට පවා ඔවුන් ඊට මැදිහත්ව ඒ ගැන විමසන්න පවා ඉදිරිපත් වුණා. ඒ වෙනුවෙන් ප්‍රමුඛත්වය ගත්ත ඉනෝකා සත්‍යාංග නී සහෝදරියට වගේම කමල් අද්දරආරච්චි සහෝදරයාටත් මම මෙහිදී ස්තුතිවන්ත වෙනවා.

**ඉහත පහරදීම් තුළ ඔබ මානසිකව වැටුණද දමිතා?**

කවදාවත් නැහැ. දමිතා අබේරත්න කියන කාලකාරියව මොන විදියටවත් බිමල්ට ඇදලා දාන්න  කාටවත් බැරි වුණා. යම් දේශපාලන පක්ෂවලට ගැතිවුණු ඉත්තන් 'ලක් අම්මා' 'ලක් අම්මා' කියලා සෝෂල් මීඩියාවල මට මඩ පහරවල් ගැහුවා. ඒත් මං වැටුණේ නැහැ.

කලාවෙන් ඈත්වෙලා හිටියේ මට යම් නිර්මාණ ලැබෙන එකට යම් පිරිසක් විසින් අකුල් හෙළපු නිසයි. මම අරගලයට ගියේ මේ රටේ බඩගින්නට අඬන දරුවෝ නිසයි. අරගලයට අවශ්‍ය කෑම බීම මම ගෙනත් දුන්නේ පිටරටවල ඉන්න මගේ යාළුවන්ගේ උදව් ලැබුණු නිසයි. දේශපාලනයට සහ අරගලයට මැදිවීමෙන් මට අහිමිව ගිය යමක් මිස මා ලැබූ වාසියක් නැහැ. ඒක මගේ හෘද සාක්ෂිය දන්නවා. මට ඒ හොඳටම ඇති.

**අරගලයට ගිය එක ගැන අද දුක් වෙනවද?**

නැහැ. මම සතුටු වෙනවා එයට යම් මැදිහත් වීමක් දෙන්න ලැබීම ගැන.

**නැවතත් ඔබ ක්‍රියාකාරී දේශපාලනයට මැදිවෙනවා කියන අදහසද එහි තියෙන්නේ?**

අපොයි නැහැ. දේශපාලනය කියන එක මට තිත්ත වුණා. කලා ක්ෂේත්‍රය තුළ මගේම කියන පිරිස මට කෙනෙහිලිකම් කරනකොට මම තෝරාගත්ත දේශපාලන පක්ෂය තුළින්ද මට කැපිලි කෙටිලි ආවා. ආයේ නම් කිසිම දවසක දේශපාලනයට මැදි වෙන්නේ නැහැ. කලාකරුවකුට දේශපාලනය කොහොමවත් ගැළපෙන්නේ නැහැ. ඔවුන්ට ඕනේ කලාකරුවන්ගේ නම සහ තරු ලකුණ පමණයි. වැඩේ කරගත්තට පස්සේ බොහෝ කලාකරුවන්ට හිමි වන්නේ අපකීර්තිය සහ අහිමිවීම් පමණයි. එයින් වාසි ගෙන සඳළුතලවලට නගින්නේ සීමිත පිරිසක් පමණයි.

**හොඳයි, සිත්තැවුල් කලකිරීම් අතහැරලා දාලා අපි යමු ඔබේ නැවත පැමිණීම වෙත. 'රූම් නම්බර් 106'?**

අනිවාර්යයෙන්ම 'රූම් නම්බර් 106' ගැන කතාකළ යුතුමයි. නම් ගම් පමණක් මනඃකල්පිත වූ සත්‍ය සිදුවීමක් රැගත් ඒ අපූර්වතම නිර්මාණයෙහි දායිකාවක වෙන්න ලැබීම අප්‍රමාණ සතුටක්.

**පුලස්තිගේ විවාහක බිරියගේ චරිතය ඔබට ලැබෙන විට එයට කිසිවකු අකුල් හෙළා තිබුණේ නැද්ද?**

ඇයි නැත්තේ? සුරංග අල්විස්ගෙන් මම ඇහුවා. අවුරුදු ගානකට පස්සෙයි මේ මම නිර්මාණයකට දායක වෙන්නේ. මාව ගන්න එපා කියලා කවුරුත් බලපෑමක් කළේ නැද්ද 'සූ' කියලා. ඔහු මගේ සමීපතම මිතුරෙක්. මම ඔහුට කතා කරන්නේ 'සූ' කියලයි. ඔහු අමුතු හිනාවක් දාලා කිව්වා 'දමිතා දැන් ඉමේජ් නැහැ. එපා... ෆිල්ම් එක වැටෙයි' කියලා බොහෝ දෙනා කිව්වලු.

**සුරංග අල්විස් එය මායිම් කළේ නැතුවද?**

අදටත් අබිරහසක්ව පවතින මේ ගුප්ත කතා පුවත සිනමාවට නගන්න අදහස හිතට එනකොටම සුරංගගේ ඔළුවට පුලස්තිගේ බිරියගේ චරිතය වෙනුවෙන් අසුරුසැණින්ම ආවේ මාවලු. ඔයා අකැමැති වුණා නම් මට මේ චරිතෙට විකල්පයක් නැහැ. ඕනෑවට වැඩිය මහන්සි වෙන්න දෙයක් නැහැ දමිතා. ඔයා තමයි පුලස්තිගේ බිරියට හරියටම හරියන නිළිය. රිලැක්ස් එකේ ඇක්ෂන් කියනකොට වෙනදා වාගෙම රඟනොපා රඟපාපන් කියලා ඔහු මට කිව්වා.

**ඔබ ඒ විශ්වාසයට හරියන විදියට සාධාරණයක් කළාද?**

අනිවාර්යයෙන්ම මම එය කළා. මට ඒක දැනුණා. හරියටම ඒ හැඟීම ස්ථිර වුණේ මට ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර අසීමිත නිසයි.

**සුරංග අල්විස් ඔබට ඇක්ෂන් කියලා කිව්වට සමහර සීන්වලදී 'කට්' කියන්න ඔහුට අමතක වුණාලු?**

සත්තකින්ම කියනවා නම් ඔහු මට කිව්වා. ඒ තරමටම මම  පුලස්තිගේ බිරියට ආරූඪ වුණා. ඔහුට කට් කියන්න හිත හදාගන්න බැරි වුණාලු. සමහර සීන්වලදී සෙට් එකේ හැමෝම තුෂ්ණීම්භූත වෙලා බලා හිටියා. විශේෂයෙන්ම පුලස්ති ඔහුගේ අනියම් පෙම්වතියව මරලා දාලා තමන්ගේ බිරිය හමුවේ පාපෝච්චාරණය කරලා ගෙදරින් පලායන දර්ශනය තුළ මම බොහොම හැඟීම්බර වුණා. ඒ දර්ශනය අවසානයේදී සුරංග මගේ ළඟට ඇවිදින් මම ඔහුට අවශ්‍ය පුලස්තිගේ බිරියව හරි අගේට චිත්‍රපටය වෙනුවෙන් තිළිණ දුන්න බව ප්‍රකාශ කළේ සෙනෙහෙබර වැලඳගැනීමකිනුයි.

**ඔබේ නැවත ආගමනය 'රූම් නම්බර් 106' වැනි සංකීර්ණ නිර්මාණයකින් එලෙස ආරම්භ වුණා?**

අනිවාර්යයෙන්ම. බිමල් ජයකොඩි වැනි ප්‍රවීණයකු සමග එයට සම්බන්ධ වූ අතිදක්ෂ සියලු කලා ශිල්පීන් ඉතා අගනා නිර්මාණයකට සම්බන්ධ වූ සතුට ආත්ම තෘප්තිය අද භුක්ති විඳිනවා. ඒ වගේම නැවත බලපෑම්වලට යට නොවී නැවත මට රංගනයේ දොරටු විවර කර දුන් 'රූම් නම්බර් 106' චිත්‍රපටයට දායක වූ සෑම නිර්මාණ ශිල්පියෙකුටම මම ස්තුතිවන්ත වෙනවා.

මල්මි කෞෂල්‍යා



## වෘෂභ-කටක-මීන නොසිතූ සල්ලි කන්දක්...
## ලෝකයට සාමය-ලංකාවට අර්බුද
## මේෂ-තුලා වහාම ප්‍රවේසම් වන්න...

19 පිටුව...

### ශිෂ්‍යත්වයට දින 20යි...

මව්රට දැන් ඉරිදා
2026 ජූලි 19

# කේන්දරේ
ගලපන ගැලපෙන තැන...

### 100%ක් ප්‍රතිඵල ස්ථිරයි...

ග්‍රහ අපල දුරු කර

# ශිෂ්‍යත්වයෙන් ඉහළම ලකුණු ගන්න විස්මිත අනුභයක්...

2026 ශිෂ්‍යත්වයට තවත් ඇත්තේ හරියටම දින 20කටත් අඩු ප්‍රමාණයකි. මේ වනවිට බොහොමයක් දරුවන්ගේ දැනුම කොතරම්ද යන්න මවුපියන් සහ ගුරුවරුන් නිසි ලෙස හඳුනාගෙන අවසන්ව ඇතුවාට සැකයක් නැත. එනිසාම ඒ ඒ දරුවන් ගැන යම් අනුමානයක් කරන්නට ගුරුවරුන්ට සහ මවුපියන්ට මේ වනවිට හැකියාව ඇතැයි සිතමි. පසුගිය වසරවල විභාග ප්‍රතිඵල බලන විට සමත් වේයැයි සිතූ ඇතැම් දරුවන් අඩු ලකුණු ලබාගත් අවස්ථාත්, අසමත් වේයැයි සිතූ දරුවන් වැඩි ලකුණු ලබාගත් අවස්ථාත් දක්නට ලැබෙයි. එසේ වන්නේ කෙසේද යන්න විමසා බැලීමේදී පැහැදිලිව පෙනීයන්නේ විභාගය පැවැත්වෙන දින පවත්නා ග්‍රහ තත්ත්වය විභාගයට මුහුණ දෙන දරුවන්ගේ ක්‍රියාකාරීත්වයට සහ බුද්ධියට බලපාන බවකි. මෙහිදී සඳුගේ ගමන විශේෂ වෙයි. චන්ද්‍රයා දින දෙකහමාරකට වතාවක් තම රාශිය මාරු කරන්නෙකි. ඒ අනුව අදාළ දිනයේ ග්‍රහ තත්ත්වය අනුවත් ඒ ඒ දරුවන්ගේ මහ දශා අන්තර් දශා අනුවත් වඩාත් සැලකිලිමත් විය යුතු කාරණා කිහිපයකි.

යම් දරුවෙකු අධ්‍යාපනයට, ඥානයට උදව් දෙන ග්‍රහයකුගේ මහ දශාවක් අන්තර් දශාවක් ගතවන්නේ නම් එම දරුවාට කලාන්තරයක් පුරා ලැබුණු යහපත් ප්‍රතිඵලය විභාගය දිනයේ චන්ද්‍රයාගේ ස්ථානගත වීම තුළ වෙනස් විය හැකිය. උදාහරණයක් ලෙස ගත්විට චන්ද්‍රයා සෙනසුරුගෙන් දෙවැන්නට, අටවැන්නට, දොළොස්වැන්නට වැනි තැනකට යාමත්, එසේත් නැත්නම් ග්‍රහයන් කිහිප දෙනකු ගෝචර වූ රාශියකට චන්ද්‍රයා ගෝචර වීමත් තුළ යම් තීරණාත්මක වෙනස් වීමකට අවස්ථාව උදාවෙයි.

එසේ වූ විට ඉතා දක්ෂ දරුවන් පවා අසමත් වන අවස්ථා උදාවිය හැක. මේ නිසා විභාගයට යෑමට මත්තෙන් දරුවාගේ කේන්දර කලින්ම බලවා ගැනීම යහපත් ක්‍රියාවකි. එවිට අසුබතා කලින් හඳුනාගෙන ප්‍රතිකර්ම කරගැනීමට පහසුව සැලසෙයි.

මේ ආකාරයටම ඔබගේ දරුවාගේ කේන්දරයේ අදාළ දිනයට අසුබතා යෙදේ නම් හොඳම කාරණය කල්තබා ප්‍රතිකර්ම කරගැනීමයි. එවිට විභාගය දිනයේ දරුවාට සාමාන්‍ය වටපිටාවක පිළිතුරු සැපයීමේ භාග්‍යය හිමිනු ඇත.

කෙසේ නමුත් ඔබ මෙලෙස දරුවාගේ අයහපත් ග්‍රහ තත්ත්වයක් වටහා ගත්තේ නම් ඊට ඉතා බලගතු සහ ප්‍රබල බුදු ගුණ ප්‍රතිකර්මයක් මෙසේ දක්වමි.

මේ සඳහා අවශ්‍ය වන්නේ එක සමානව කපාගත් තඹ බෝ පත්‍ර සතකි. එම බෝ පත්‍රවල සබ්බ පාපස්ස ගාථාව පැහැදිලිව ලියා පසුව එම බෝ පත්‍ර දරුවාගේ නමට වේලාවට ලග්නයට බලගන්වාගත හැකි නම් ඉතා යහපත්ය. කෙසේ නමුත් ඔබ මෙලෙස කපාගත් බෝ පත්‍ර හත සබ්බ පාපස්ස ගාථාවෙන් නිසි ලෙස 1008 වර බැගින් බලගන්වා ගන්න. එම කටයුත්ත කරන විට දරුවාට වඩාත් ගැළපෙන නැකතක එම කටයුතු කිරීම වඩාත් යහපත්ය. එසේ බලගන්වා නිසි ලෙස පිළියෙල කරගත් තඹ බෝ පත්‍ර නූල්පටක ගැටග සා බෝධියක දවටා සුදුසු පරිදි බෝධි පූජාවක් තබා තම අවශ්‍යතා සිහිපත් කිරීමෙන් දරුවා ඉන් ඉහළ ලකුණු ප්‍රමාණයක් ගන්නා බව අප අත්දැකීමෙන් දනිමු.

කෙසේ නමුත් මෙම බෝපත්‍ර සැකසීමට පෙර අදාළ දරුවාගේ වර්තමාන දශාවන්, අන්තර් දශාවන් සහ ග්‍රහ තත්ත්වයන් ගැනද සැලකිලිමත් වන්න. මේ පිළිබඳ ඔබට අවබෝධයක් නොවේ නම් මේ සම්බන්ධ දැනුමක් ඇති අලස නැති ජ්‍යොතිෂවේදියකු ලවා දරුවාගේ කේන්දරය පරීක්ෂා කරවාගෙන අදාළ කටයුතු කරගන්න.

මෙය 100%ක් ප්‍රතිඵල ස්ථිර පූජාවකි. ඒ නිසා ඉතා භක්තියෙන් යුතුව මෙම පූජාව කිරීම ඉතා යහපත්ය.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී**
**ජ්‍යොතිෂ පර්යේෂක**
**ජ්‍යොතිෂ පුවත්පත් රැසක**
**හිටපු ප්‍රධාන කර්තෘ**
**ජේ.එන්.කේ. රත්නායක**
**0777579404**

# ලග්න රැසකට හදිසි ධන යෝග



**2026 ජූලි 19 වැනිදා සිට 25 වැනිදා දක්වා දින හතක කාලය තුළ ග්‍රහ තත්ත්වය විමසීමේදී රවි කටක රාශියේත්, සඳු කන්‍යා රාශියේත්, කුජ වෘෂභ රාශියේත්, බුධ මිථුන රාශියේත්, ගුරු කටක රාශියේත්, සිකුරු සිංහ රාශියේත්, ශනි මීන රාශියේත්, රාහු කුම්භ රාශියේත්, කේතු කන්‍යා රාශියේත් ගෝචරව සිටියදී සතිය ආරම්භ වෙයි. ඒ අනුව මෙම සතිය තුළ ඔබට සහ රටට කෙසේද යන්න විමසා බැලීමේදී ලෝකයේ තරමක් සාමකාමී නිහඬ තත්ත්වයක් පෙන්නුම් කරනු ඇත. එහෙත් ප්‍රධාන පෙළේ රාජ්‍ය නායකයන්ට සහ ආයතනවලට යම් අර්බුදකාරී කාරණාවලට මුහුණ දීමට සිදුවනු ඇත.**

තාක්ෂණික අංශයෙන් දියුණු නව නිර්මාණ ගැන අසන්නට ලැබෙන කාලයකි. ප්‍රධාන පෙළේ රටකින් හදිසි අනතුරු ගැන අසන්නට ලැබෙන අතර, එය ලෝකයේ උතුරු දිශාවෙන් පිහිටි රටක් විය හැකිය. එමෙන්ම ලෝකයේ ප්‍රසිද්ධ මූල්‍ය සමාගම් හෝ ආයතන තුළ යම් ගැටලුකාරී තත්ත්වය ඉස්මතු වනු ඇත. එවැනි පුවත් අසන්නට ලැබෙන කාලයකි.

ලංකා කේන්ද්‍රයට අනුව විමසීමේදී රට තුළ යම් යම් ගැටලුකාරී තත්ත්ව යළි ඉස්මතු විය හැකි ග්‍රහ තත්ත්වයක් පෙන්නුම් කෙරේ. විශේෂයෙන්ම ලෙඩ රෝග සම්බන්ධ ආරංචි අලුත් විය හැකි බැවින් ජනතාව ප්‍රවේසම් වීම වැදගත්ය. ඒ වගේම හදිසි අනතුරු සම්බන්ධ පුවත් ඇසෙන කාලයකි. විශේෂයෙන්ම ඉන්ධන සහ ගෑස් සම්බන්ධ කාරණා ගැන ජනතාව තුළ උනන්දුවක් හෝ කතාබහක් ඇතිවිය හැක. කෙසේ නමුත් සතිය අවසන් කාලයේදී පැරණි සහ යටපත් වූ පුවත් යළි කතාබහට ගැනෙන්නටත්, ඉතිහාසය, පුරාවස්තු හෝ ඊට සමාන කාරණා ගැන කතාබහක් ඇතිවීමටත් ඉඩ ඇත. ඉහත ග්‍රහ තත්ත්වය අනුව විමසීමේදී ඒ ඒ ලග්නවලට කෙසේදැයි විමසා බලමු.

### මේෂ ලග්නය
## ප්‍රවේසම වැදගත්

සතිය ආරම්භයේදී තරමක් කල්පනාකාරීව කටයුතු කළ යුතු වෙයි. අනවශ්‍ය ප්‍රශ්න, අනවශ්‍ය වියදම් මෙන්ම මූල්‍ය පාඩුද සිදුවිය හැකි සතියකි. එමෙන්ම ඥාතීන් අතර අසමගිකම් ඉතා සමීප හිත මිත්‍රයන් අමනාප වීම මෙන්ම දුරබැහැර ගමන්බිමන් යෙදීමටද ඉඩ ඇත. ණය ගනුදෙනු සම්බන්ධව යම් යම් කතාබස් ඇතිවන කාලයකි. විශේෂයෙන්ම ශරීරයේ විවිධ අපහසුතා සඳහා ප්‍රතිකාර ගන්නට සිදුවිය හැකිය. නහර සම්බන්ධ අපහසුතා සහ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා කෙරෙහි විවිධ බාධා පැමිණෙනු ඇත. පපුව ආශ්‍රිත වේදනාවලින් සහ කැස්ස වැනි අපහසුතාවලින් ප්‍රවේසම් වීම වැදගත්ය. සතිය අගභාගයේ මෙම තත්ත්වයේ යම් වෙනසක් සිදුවන අතර සුළු සුළු මුදල් ලාභ සහ ගමන් බිමල් සම්බන්ධ ආරාධනා ආරංචි ලැබෙනු ඇත.

### වෘෂභ ලග්නය
## දියුණුවට හේතු

ඔබට මෙම සතිය තුළ උත්සාහයේ තරමට ප්‍රතිඵල ලබාගත හැක. විශේෂයෙන්ම පවුලේ අයගේ උදව් උපකාර ලැබෙන අතර, උසස් සහ ප්‍රභූ පැලැන්තියේ විශේෂ ලැබීම් යෙදෙනු ඇත. හදිසි ධන ලාභ යෙදීමෙන් අතමිට සරුවන කාලයකි. එනිසා ලොතරැයි මිලට ගැනීමට හෝ ඊට සමාන කටයුතුවලින් වාසි අත්වේ. සතුරන් පරදා ජය ලැබිය හැකි කාලයකි. රැකියා ස්ථාවලින් විශේෂ වරප්‍රසාද ලැබෙනු ඇත. ආශ්‍රයට සුදුසු අය හමුවන සතියකි. හැම අතින්ම යහපත් කාලයකි. අනාගත දියුණුවට මඟ පෑදෙනු ඇත.

### මිථුන ලග්නය
## විශේෂ වාසි

රාජ්‍ය අංශයෙන් විවිධ චෝදනා අපවාද ප්‍රශ්න ඇතිවීමට හෝ රාජ්‍ය අංශයට සම්බන්ධ ආයතනවලින් විවිධ ආරංචි ලැබෙන්නට හැකි කාලයකි. කෙසේ නමුත් දුරබැහැර ගමන් යෙදෙනු ඇත. හිත තරමක් අහංකාර වේ. ඒ නිසා පාඩු සිදුවිය හැකි කාලයකි.

අනාගත දියුණුවට කරන වැඩකටයුතු කෙරෙහි යහපත් තත්ත්වයක් පෙන්වයි. දුරබැහැර සිටි ඥාතියෙකු, මිතුරෙකු ඔබ සොයා පැමිණේ. අමුතු වැඩ කිරීමට සිතෙන කාලයකි. කලකට පෙර ඔබට ලැබෙන්නට තිබූ මුදලක් ඔබට ලැබෙන්නට නියමිත අතර, ඒ පිළිබඳ උනන්දු වන්න. නව ආයෝජන සහ මූල්‍ය කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමුවනු ඇත. සතිය අගදී විශේෂ ආර්ථික වාසි අත්වනු ඇත.

### කටක ලග්නය
## නව සබඳතා

සතිය ආරම්භයේදීම තම අරමුණු කිහිපයක් ඉටුවන බවට ආරංචි ලැබෙනු ඇත. ඉඩකඩම් සම්බන්ධ වාසි සහ ලාභ ලැබෙන කාලයකි. මෙතෙක් ලැබෙන්නට තිබූ මුදලක් හදිසියේ ලැබීම නිසා සිතට සතුට ඇතිවේ. එමෙන්ම රාජ්‍ය අංශයෙන් මුදල් සහ දීමනා හිමිවන කාලයකි. තමාගේ අවශ්‍යතා කෙරෙහි අන් අයගේ උනන්දුව යොමුවනු ඇත. නව සම්බන්ධතා සහ විශේෂ අමුත්තන් හමුවීමෙන් ආර්ථිකයට වාසි අත්වේ. නව තනතුරු සහ වැටුප් වර්ධක ලැබෙන සතියකි. ගමන් බිමන්වලදී හදිසි ධන ලාභ යෙදේ. අන් සතු ධනයක් හෝ වස්තුවක් ලැබෙන්නට ඉඩ ඇති නිසා අවධානය ඉතා වැදගත් වේ.

### සිංහ ලග්නය
## ආර්ථික සැලසුම්

කලක සිට සැලසුම් කළ විශේෂ කාරණා සම්බන්ධ හදිසි ආරංචි ලැබේ. ඒවා ඉතා යහපත් මට්ටමේ ආරංචි විය හැක. විශේෂයෙන්ම නව ව්‍යාපෘති සහ වැඩසටහන් ගැන සතුටුදායක පුවත් ලැබෙනු ඇත. මෙතෙක් කලක් නොලැබුණු එහෙත් ඔබට ලැබිය යුතු මුදලක් ඔබ අතට පත්වේ. එමගින් හදිසි වෙනසකට හේතු යෙදෙනු ඇත. නව සිතුවිලි පහළ වන අතර, ස්ත්‍රී පුරුෂ සබඳතා තර වන සතියකි. කලබලයට කරන කටයුතු කෙරෙහි සිත යොමුවිය හැකි බැවින් ඒ ගැන කල්පනාකාරී වීම වැදගත්ය. සෑම අතින්ම ලැබීම් සහිත සතියක් බැවින් තම අරමුණු ජයගැනීමට උත්සාහවන්ත වීම ඉතා වැදගත්ය. සති අග විශේෂ ලැබීම් සහිතය. සිත් සතුටට හේතු යෙදේ. විවිධ ක්‍රමවලින් වාසි අත්වනු ඇත.

### කන්‍යා ලග්නය
## ඥාතීන්ගෙන් උදව්

දිගු කලක සිට සැලසුම් කළ කටයුත්තක් සාර්ථක කරගන්නට අවස්ථාව උදාවෙයි. නව ආයෝජන සඳහාද අවස්ථා හිමිවන අතර, විශේෂ මූල්‍ය වාසිද හිමිවනු ඇත. රැකියා ස්ථානවල තිබූ ප්‍රශ්න විසඳන්නට අවස්ථාව ලැබේ. මිතුරන්ගෙන් විශේෂ උදව් ලැබෙනු ඇත. ගැටෙන වැටෙන වැඩ ප්‍රවේසමෙන් කළ යුතු සතියකි. එමෙන්ම නව සබඳතා තරවෙයි. දුරබැහැර සිටින අය ඔබ සොයා එනු ඇත. හදිසි මුදල් ලාභ ලැබෙන සතියක් බැවින් ඒ ගැන අවධානය වැදගත්ය. සතිය අගදී සිතේ සතුටට හේතු යෙදේ.

### තුලා ලග්නය
## ප්‍රවේසම වැදගත්

මේ සතියේ ඉතා ප්‍රවේසම් සහිතව කටයුතු කිරීම වැදගත් වෙයි. වැටෙන ගැටෙන වැඩ සුබ නැත. තැන්පත් ධනය වර්ධනයට අවස්ථා ඇතත් එම කටයුතු විවිධ හේතු නිසා ප්‍රමාද වේ. එනිසා අවධානයෙන් කටයුතු කර එම වාසි අත්පත් කරගන්නට උනන්දු වන්න. රැකියා ස්ථානයේ විශේෂ ලැබීම් ඇත. නව තනතුරු සහ උසස්වීම් හිමිවිය හැකි කාලයකි. ඒ සම්බන්ධ සිත් රිදවීම්ද පෙන්නුම් කරයි. කල්පනාකාරීව කටයුතු කරන්න. විරුද්ධ ලිංගිකයන් සමග සම්බන්ධතා තරකරන සතියකි. සතිය අගදී හදිසි ගමනක් හෝ හදිසි වැඩක් යෙදෙනු ඇත.

### වෘශ්චික ලග්නය
## බලාපොරොත්තු ඉටුවීමක්

මෙතෙක් කලක් තිබූ බලාපොරොත්තුවක් ඉටුවීමෙන් සිතේ සතුටට හේතු යෙදෙන සතියකි. මුදල් සම්බන්ධ කතාබහක්ද ඇතිවනු ඇත. ව්‍යාපාරයක් ගැන කතාබහක් ඇතිවේ. එවැනි කටයුත්තක් ඇරඹීමට සිතුවිලි පහළ විය හැකිය. දුරබැහැර ගමනකට හේතු යෙදේ. එම ගමනින් ආර්ථික වාසියක් අත්වනු ඇත. විශේෂ පුද්ගලයන් සමග සාකච්ඡා යෙදෙන අතර එමගින් වාසි අත්වේ. නව සබඳතා ගොඩනැගේ. විශේෂයෙන් රැකියා සම්බන්ධ නව සැලසුමකටද ඉඩ ඇත.

### ධනු ලග්නය
## ගමන් බිමන්

ධනු ලග්න හිමි ඔබට මෙම සතියේ ගමන් බිමන් අධික කෙරෙන අතර විශේෂ ගමන් කිහිපයක්ද යෙදෙනු ඇත. එමෙන්ම පරණ හෝ අතහැර දැමූ දෙයින් ලාභ ලබාගත හැකි කාලයකි. විශේෂ වාසි සහිත කටයුතු කිහිපයකටම යෑමට අවස්ථාව යෙදේ. රැකියාවේ උසස්වීමක් වෙනසක් සම්බන්ධව තොරතුරු ලැබෙනු ඇත. මෙතෙක් කලක් පැවැති අසනීප සුවවනු ඇත. අලුත් යානවාහන සහ ඉඩකඩම් මිලට ගන්නට හැකිවන කාලයක්ද වෙයි. අලුතින් සැලසුම් කළ යමක් ආරම්භයට අවස්ථාව යෙදේ.

### මකර ලග්නය
## විශේෂ උත්සව

කලක සිට සැලසුම් කළ උත්සවයකට සම්බන්ධ වීමට අවස්ථාව යෙදෙන අතර ඉන් ආර්ථික වාසියකටද ඉඩ යෙදේ. තමාගේ වුවමනාවට වඩා අන් අයගේ අවශ්‍යතා කෙරෙහි උනන්දු වන සතියකි. නිතර නිතර සිතට වධ දුන් කාර්යයක් අවසන් කරගන්නට ඉඩකඩ යෙදේ. තම හිතවතුන්ගෙන් විශේෂ ආරාධනා ලැබෙනු ඇත. සතිය අගදී හදිසි ධන ලාභ ඇත. ලොතරැයි මිලට ගැනීමට ඉතා සුබ සතියකි. අන් සතු ධනයක් ලැබෙන්නට හේතු යෙදේ. එහෙත් අනවශ්‍ය වියදම්ද අධික වන බව පෙන්වයි.

### කුම්භ ලග්නය
## කලබල සතියක්

තරමක් කලබලකාරී සතියකි. වැඩකටයුතු බහුල වන බවක් පෙන්වයි. ගමන් බිමන් වාසි අත්වන අතර, නිතර නිතර තම අරමුණු වෙනස් කරන බවද පෙන්නුම් කෙරේ. අතමිට මුදල් ගැවසෙන බැවින් අනවශ්‍ය දේට මුදල් වියදම් විය හැකිය. එහෙත් කල්පනාකාරීව කටයුතු කළහොත් විශේෂ දියුණුවක් අත්කරගත හැකි බවක්ද පෙන්වයි. තමාට ලැබෙන්නට තිබූ මුදල් ලැබෙන අතර අන් අය සමග ගැටුමට නොයා යුතු සතියකි. ඇතැම් විට තමන් නොසිතූ ආකාරයේ ධනයක් ඔබට හිමිවීමටද ඉඩ ඇත. එම නිසා අවධානයෙන් පසුවීම තම වාසියට හේතු වනු ඇත.

### මීන ලග්නය
## නව රැකියාවකට අවස්ථා

මීන ලග්න හිමි ඔබට නව රැකියා පිළිබඳ බලාපොරොත්තු ඉටුවන සතියකි. එසේම අනාගතය උදෙසා කරන ආයෝජන සඳහාද අවස්ථා යෙදෙන අතර අන් අය සමග කරන කටයුතුවලදී තම වාසියට හේතු යෙදේ. දුරබැහැර සිටින මිතුරන්ගෙන් උදව් ලැබේ. අනාගතය උදෙසා නව සැලසුම් ක්‍රියාත්මක කෙරෙන අතර, ඉන් විශේෂ වාසි අත්වන හදිසි ලාභ මෙන්ම විශේෂ අවස්ථාද හිමිවනු ඇත. නොසිතූ ධන ලාභයකට ඉඩ ඇති බැවින් ඒ ගැනද අවධානයෙන් පසුවන්න. ඉතා සුබ සතියකි. පෙර පින පලදෙනු ඇත.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී
ජ්‍යොතිෂ පර්යේෂක
ජ්‍යොතිෂ පුවත්පත් රැසක
හිටපු ප්‍රධාන කර්තෘ
ජේ.එන්.කේ. රත්නායක
0777579404**


B5